2024.08.27

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## බුද්ධ ධර්මය
## 6 ශ්‍රේණිය

විභාග අංකය/නම ..............................

කාලය පැය 02 යි

පොදු උපදෙස්
❖ ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මුළු ලකුණු 40කි.

### I කොටස

❖ ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) සිදුහත් කුමරුගේ මව වූයේ,

i) යශෝධරා දේවියයි.
ii) මහාමායා දේවියයි.
iii) මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි.
iv) කිසා ගෝතමී දේවියයි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

2) ශරීර ලක්ෂණ අනුව කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව පැවසුවේ,

i) වප්ප බමුණාය.
ii) කොණ්ඩඤ්ඤ බමුණාය.
iii) භද්දිය බමුණාය.
iv) අස්සජි බමුණාය .

3) සතර පෙරනිමිතිවල දෙවැන්න,

i) මහල්ලෙක් ය.
ii) ලෙඩෙක් ය.
iii) මළසිරුරක් ය.
iv) පැවිදි රුවක් ය.

4) බුද්ධ රත්නය වන්දනා කරන ගාථාව වන්නේ,

i) ඉතිපිසෝ භගවා අරහං....යන ගාථාවයි.
ii) සුපටිපන්නෝ භගවතෝ... යන ගාථාවයි.
iii) ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ... යන ගාථාවයි.
iv) වන්දාමි චේතියං සබ්බං....යන ගාථාවයි.

5) "මේ වැලි දෝතේ වැලි කැට ප්‍රමාණයට මට ගුරුවරුන්ගේ අවවාද ලැබේවායි" ප්‍රාර්ථනා කළේ,

i) සුනීත පොඩි හාමුදුරුවෝය.
ii) ආනන්ද හාමුදුරුවෝය.
iii) නන්ද හාමුදුරුවෝය.
iv) රාහුල හාමුදුරුවෝය.

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

6) ....................................මානවකයා අභියෝග ජයගත් තරුණයෙකි.
7) කාලය, දීපය, දේශය, කුලය, මව ආදී කරුණු.........................................ලෙස හැඳින්වේ.
8) සීල, සමාධි, ප්‍රඥා ........................................ නමින් හැඳින්වේ.
9) විහාරස්ථානයකදී අප විසින් පළමුවෙන්ම වන්දනාමාන කරන්නේ.................................වයි.
10) රාහුල කුමරුගේ මව වූයේ...........................................යි.

(ත්‍රිශික්ෂාව, යශෝධරා දේවිය, මඝ, වෙහෙර වහන්සේ, පස් මහ බැලුම් )

- අංක 11 සිට 15 තෙක් දක්වා ඇති ප්‍රකාශ හරිනම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11) සිගාලෝවාද සූත්‍රයේ දී දෙමාපියන් නැගෙනහිර දිශාවට උපමා කොට තිබේ. ( )
12) ශරීර ලක්ෂණ අනුව කුමරු ඒකාන්තයෙන්ම බුදුවන බව කොණ්ඩඤ්ඤ බමුණා පැවසුවේය. ( )
13) අනුන්ට අයහපතක් සිදුවුවද, තමන්ට යහපතක් වන්නේ නම් එබඳු ක්‍රියා කුසල ක්‍රියාවේ. ( )
14) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන කරුණු හතර දියුණුවේ රන් දොරටු ලෙස හැඳින්වේ. ( )
15) ජාතික ගීයේ නිර්මාතෘවරයා ආනන්ද සමරකෝන් මහතාය. ( )

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල A තීරුවේ දැක්වෙන ස්ථාන B තීරුවේ දැක්වෙන තැනැත්තන් සමඟ නිවැරදිව ගලපා යා කරන්න.

| A | B |
|---|---|
| 16) රජගහ නුවර | 1) මහා මායා දේවිය |
| 17) කිරිපිඬු දානය | 2) රාහුල හාමුදුරුවෝ |
| 18) දෙව්දහ නුවර | 3) බිම්බිසාර රජතුමා |
| 19) කුස තණ මිටි අට | 4) සුජාතා සිටු දේවිය |
| 20) අම්බලට්ඨිකා ආවාසය | 5) සොත්ථිය බමුණා |

(ලකුණු 2X20 = 40 )

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ද ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය ට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60කි.

(1) දෙවන වාරයට අදාළව ඔබ විසින් පන්ති කාමරයේ දී සිදු කරනු ලැබූ ඇගයීම ඇසුරෙන් i සිට x දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i) එම ඇගයීමට පාදක කරගත් පෙළපොතෙහි සඳහන් පාඩමේ මාතෘකාව කුමක්ද?
ii) ඇගයීම සඳහා ඔබ විසින් සිදු කරනු ලැබුවේ කුමක්ද?
iii) ඇගයීම් ක්‍රියාකාරකම සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් 02ක් ලියන්න.
iv) අදාළ ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ඔබට මුහුණ දීමට සිදු වූ ගැටළු 02ක් ලියන්න.
v) ඇගයීම සිදු කිරීමේදී ඔබට සහය ලබාදුන් දෙදෙනෙකු නම් කරන්න.
vi) ඇගයීම සිදුකිරීම මගින් ඔබට ලැබුණු අත්දැකීම් 02ක් ලියන්න.
vii) පන්සිල් පද දෙකක් ලියා දක්වන්න.
viii) සෑම සිල් පදයක්ම තුන් ආකාරයකින් ආරක්ෂා කිරීම කළ යුතුය. එය කුමන නමකින් හැඳින්වේ ද?
ix) සීලයෙහි ප්‍රභේද දෙක නම් කරන්න.
x) ඔබ විසින් සිදු කරන ලද යහපත් ක්‍රියා දෙකක් ලියන්න.

(ලකුණු 2x10=20)

(2)

i) බුදුරජාණන් වහන්සේ සිගාල ගෘහපතියාට දේශනා කළ සූත්‍රය කුමක්ද?
ii) සිව් බඹ විහරණ වලින් තුනක් (03) ලියන්න.
iii) දෙමව්පියන් විසින් දරුවන්ට කරුණු පහකින් සංග්‍රහ කරනු ලබයි. ඒවා ලියා දක්වන්න.

(ලකුණු 2+3+5 = 10 )

(3)

i) ත්‍රි ශික්ෂා වලින් දෙකක් (02) නම් කරන්න.
ii) සම්මා වාචාවට අයත් (යහපත් වචන) කරුණු තුනක් (03) සඳහන් කරන්න.
iii) සිල්වත් වීමෙන් ලැබෙන ආනිසංස පහ ලියන්න.

(ලකුණු 2+3+5 = 10 )

(4)

i) මෙත්තා හෙවත් මෛත්‍රිය යනු කුමක්ද?
ii) භාවනාව වඩන විට ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් හිඳ ගත යුතු ආකාර දෙක (02) නම් කරන්න.
iii) මෛත්‍රිය වැඩීමේ ආනිසංස පහක් (05) ලියන්න.

(ලකුණු 2+3+5 = 10 )

(5)

i) ඔබ වන්දනා කටයුතු සඳහා විහාරස්ථානයට යන අවස්ථා දෙකක් නම් කරන්න.
ii) පහන් පූජා කරන ගාථාව ලියන්න.
iii) විහාරස්ථානයේදී සිදු කරන වතාවත් පහක් ලියන්න.

(ලකුණු 2+3+5 = 10 )

(6)

i) 'වෙනස්වීම' බුදු දහමේ හඳුන්වන්නේ කුමන නමකින්ද?
ii) වෙනස්වීම නිසා අපට පසු කිරීමට සිදුවන අවධි තුනක් ලියන්න.
iii) "ලෝකයේ පණ ඇති හා පණ නැති සියල්ල සෑම මොහොතකම වෙනස් වේ."මෙම කියමන සනාථ කරන ඔබ අවට පරිසරයේ දක්නට ලැබෙන සිදුවීම් පහක් ලියන්න.

(ලකුණු 2+3+5 = 10 )

(7)

i) දියුණුවේ දොරටු ඇතුළත් වන ජාතක කතාව නම් කරන්න.
ii) එහි සඳහන් දියුණුවේ දොරටු තුනක් නම් කරන්න.
iii) නිරෝගී බව රැකගැනීම සඳහා ඔබ විසින් කළ යුතු දේවල් පහක් ලියන්න.

(ලකුණු 2+3+5 = 10 )

REGISTRAR
De Mazenod College
Kandana.